# සාමාන්‍ය සමයේ දස නවවන සතිය
# බදාදා

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 18:15–20

**"ඔබ කියන දේ ඔබ පිළිගත්තොත්
ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තෙහි ය."**

"ඔබගේ සහෝදරයා ඔබට විරුද්ධව පව් කළොත් ඔහු හමු වී ඔහුගේ වරද පෙන්වා දෙන්න. ඔබ කියන දේ ඔහු පිළිගත්තොත් ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තෙහි ය. නොපිළිගත්තොත්, සාක්ෂිකාරයන් දෙදෙනෙකුගේ හෝ තුන් දෙනෙකුගේ හෝ සාක්ෂියෙන් හැම පැමිණිල්ලක්ම ස්ථිර වන පිණිස ඔබ සමග තවත් එක් කෙනෙකු නොහොත් දෙදෙනෙකු කැඳවාගෙන යන්න. ඔහු ඔවුන් කියන දේත් නොපිළිගත්තොත් සභාවට දන්වන්න. සභාව කියන දේත් නොපිළිගත්තොත් ඔහු විජාතිකයෙකු හා අයකැමියෙකු ලෙස සලකන්න.

"සැබැවින්ම මම ඔබට කියමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නහු ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නහු ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේය."

"නැවතත් මම ඔබට කියමි. පොළොවෙහි ඔබෙන් දෙදෙනෙක් තමන් අයදින කවර දෙයක් ගැන වුව ද එකඟ වන්නෝ නම්, ස්වර්ගයෙහි වසන මාගේ පියාණන් වහන්සේගෙන් ඒ දෙය ඔවුන්ට ලැබෙන්නේය. මන්ද, යම්

තැනක දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස්ව සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි.”

සුවිශේෂ වාක්‍යය එසේය.